## 9. ශීර්ෂය 09 - පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරය

### 9.1 විගණන විෂය පථය

පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 9.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

## 9.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 9.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙළ කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. අවිනිශ්චිත සංඛ්‍යා ලේඛණ මත සංයුක්ත සැලැස්මක් සැකසීම අපහසු බව අධිකාරියේ ලේකම්වරයා විසින් 2014 ජනවාරි 07 දින මා වෙත වාර්තා කර තිබුණි.

### 9.4.2. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 9.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අධිකාරිය වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 9.4.3. වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 9.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අධිකාරය විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ඔක්තෝබර් 14 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 9.4.4. ප්‍රතිපාදන උපයෝජනය

ප්‍රාග්ධන වියදම් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ උපයෝජනය සියයට 35 ක් පමණක් විය.

**9.5 අනුකූල නොවීම්**

**------------------**

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව<br>----------------------------------- | අනුකූල නොවීම<br>----------------- |
| --- | --- |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන<br>------------------------ | |
| 2002 අංක 4 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනත 7 වන වගන්තිය | විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස දෙකක කාලසීමාවක් ඇතුළත විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා කැඳවීමේදී වග උත්තර කරුවන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කෙරෙන ඉල්ලීම් හා අභියාචකගේ නීතීඥ හෝ රැකවරණ නිලධාරීයාගේ ඉල්ලීම පරිදි දින ලබා දීමට සිදු වීමත් නිසා පනතේ සඳහන් කාලසීමාව තුළ අභියාචනා සම්බන්ධයෙන් සුදුස්සක් හෝ නියෝගයක් ලබා දීමට ප්‍රමාද වන බව අධිකාරියේ ලේකම්වරයා විසින් 2014 ජනවාරි 07 දින මා වෙත දන්වා එවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 10.4 වගන්තිය | මෙම විධිවිධාන අනුව සේවා කාලය වසර 10 ට අඩු නිලධාරින් සඳහා වසර 10 ට නොඅඩු සේවා කාලයක ස්ථිර නිලධාරියකු ඇපකරුවකු ලෙස ඉදිරිපත් කළ යුතු වුවත්, එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබියදිත් ආපදා ණය ලබා දී තිබුණි. |

**9.6 කාර්ය සාධනය**

2010 වර්ෂයේ සිට ආයතනයට ලද අභියාචනා හා අවසන් කරන ලද අභියාචනාවල සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ආරම්භක ශේෂය | වර්ෂය තුළ ලැබුනු ගණන | වර්ෂය තුළ අවසන් කළ ගණන | නිමවී නොමැති අභියාචනා ගණන | නිම කරන ලද අභියාචනාවල ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2010 | 254 | 11 | 200 | 65 | 75 |
| 2011 | 65 | 56 | 45 | 76 | 35 |
| 2012 | 76 | 256 | 141 | 191 | 42 |

2010 වර්ෂයේ අභියාචනා විනිශ්චය කිරීමේ ප්‍රතිශතය සියයට 75 ක් වුවත්, 2011 හා 2012 වර්ෂවලදී එය පිළිවෙලින් සියයට 35 ක් හා සියයට 42 ක් වී තිබුණි.

**9.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| (ආ) | ද්විතීයික මට්ටම | 12 | 09 | 03 |
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - |
| | එකතුව | 18 | 15 | 03 |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 3 ක් සම්පූර්ණ කළ යුතුව තිබුණි.